**කඩුවෙල මහා නගර සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කඩුවෙල මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු වටිනාකම රු.1,180,597,373 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.1,160,000,000 ක් ලෙස දක්වා තිබුණි. | එකඟ වන බව | ස්ථාවර තැන්පතු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.102,509,015 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.94,138,078 ක් ලෙස දක්වා තිබුණි. . | එම | ස්ථාවර තැන්පතු පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.21,852,642 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.34,390,267 ක් ලෙස දක්වා තිබුණි. | එම | ලැබියයුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | පසුගිය වර්ෂ කිහිපයක සිට පැවත එන අවලංගු කර ඇති සහ වැඩ අවසන් කර ගෙවීම් සිදු කර ඇති රු.52,417,977 ක් කර්මාන්ත ණයහිමි ශේෂය තුල ඇතුළත් වීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එම | කර්මාන්ත ණය හිමි ශේෂය නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 සහ 2022 වර්ෂවල වැඩ අවසන් කරන ලද රු.46,404,003 ක් වූ ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේ දී ගොඩනැගිලි ගිණුමට ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ගොඩනැගිලි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ඒ සඳහා ක්ෂය ගණනය නොකිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.1,160,100 ක් වැඩියෙන් ද දක්වා තිබුණි. | එම | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ අනුව ක්ෂයවීම් නිවැරදිව ගණනය කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මු.රෙ 396(ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක කාලය ඉක්මවන ලද රු.94,740ක වටිනාකමැති චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් වී නොමැති චෙක්පත් සඳහා අදාල ආදායකයින් දැනුවත් කර ලිපි යවා ඇති බව. | ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ 1653 | සභාව විසින් ත්‍රී රෝද රථ 02 ක්, ට්‍රැක්ටර් රථ 37 ක්, ටිපර් රථ 03 ක්, ලොරි රථයක් හා සිංගල් කැබ් රථයක් වශයෙන් වාහන 44 ක් මයිලෝමීටරය ක්‍රියාවිරහිත තත්වයෙන් ධාවනය කර තිබුණි. | මයිලෝ මීටර් ක්‍රියාවිරහිත වූ වාහන නැවත අලුත්වැඩියාවට යොමු කිරීමට කටයුතු කරනු ලබයි.එසේම ට්‍රැක්ටර් රථවල මීටර් අලුත්වැඩියා කළද දැඩි හිරු රශ්මියට සහ වර්ෂාවට නිරාවරණය වන බැවින් නිතර නිතර ක්‍රියාවිරහිත වීමට ලක්වනු ඇති බව. | මයිලෝ මීටරය අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 2(iv) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකර නාගරික කොමසාරිස් ඇතුළු විධායක ශ්‍රේණියේ නිලධාරින් 04 දෙනෙකු සහ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 04 දෙනෙකු සඳහා එකතුව රු.505,158 ක මුදලක් නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණි. | කසල අංගනය, ප්‍රීමික්ස් ආයතනය හා දිස්ත්‍රික් කාර්යාල තුනෙහි රාජකාරි ආවරණය කිරීම මෙන්ම පොදු සේවා කටයුතුවලට නාගරික කොමසාරිස් වශයෙන් සහභාගි වීමට නිතර සිදුවන බැවින්, එම කටයුතු ඍජුව මැදිහත් වී ඉක්මනින් ඉටුකළ යුතු බැවින්ද දිනපතා කාර්යාලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකරන බව. | සියලු රාජ්‍ය නිලධාරීන්ගේ සේවයට වාර්තා කිරීම යොමුගත චක්‍රලේඛය අනුව සිදුවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතුව පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 117 කට අදාළව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් අදාළ කාල පරිච්ඡේදය තුල සිදු කළ බවට සභාවේ කාර්මික නිලධාරීන් විසින් සහතික කර තිබුණද එම පරීක්ෂාවන් සිදු කළ බවට විගණනයේදී තහවුරු නොවුණි. | 2023 වර්ෂයේදී කඩුවෙල මහා නගර සභාව සතු වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර ඇති අතර 2024 වර්ෂයේ දී ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතින බව. | ඉන්ධන පරීක්ෂාව චක්‍රලේඛයේ උපදෙස් පරිදි සිදුකළ යුතුය. |
| (ඇ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව විසින් මිලදීගෙන වීල් ලෝඩරය, එක්ස්කැවේටර් යන්ත්‍රය සහ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය මෙතෙක් සභාව නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් වාහන කර්මාන්ත බිමෙහි පමණක් යොදවා තිබීම නිසා මෙම යන්ත්‍ර 03 ලියාපදිංචි කිරීමක් සඳහා කටයුතු සිදුකර නොමැත. නමුත් සභාව වෙත ලබා ගැනීමේදී ලැබීම් පත්‍රිකා සහ (GRN) නිකුත් කිරීම් නියෝග නිකුත් කර ඇති බව. | සභාව නමින් ලියාපදිංචි කිරීම කඩිනමින් සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.62,486,268 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.243,511,413 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම රු.000 | බිල් කළ ආදායම රු.000 | රැස්කළ ආදායම රු.000 | දෙසැම්බර් 31 දිනට හිඟය රු.000 | ඇස්තමේන්තු ගත ආදායම රු.000 | බිල් කළ ආදායම රු.000 | රැස්කළ ආදායම රු.000 | දෙසැම්බර් 31 දිනට හිඟය රු.000 |
| වරිපනම් හා බදු | 189,810 | 210,079 | 172,380 | 37,700 | 182,500 | 196,309 | 156,376 | 39,933 |
| කුලී | 9,924 | 9,557 | 11,098 | - | 12,622 | 10,059 | 7,960 | 2,099 |
| බලපත්‍ර ගාස්තු | 10,335 | 10,335 | 11,504 | - | 10,671 | 10,671 | 10,545 | 125 |
| වෙනත් ආදායම් | 14,843 | 14,843 | 14,604 | 239 | 13,240 | 13,240 | 11,542 | 1,698 |
| | 224,912 | 244,814 | 209,586 | 37,939 | 219,033 | 230,279 | 186,423 | 43,855 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| (i) 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ කීපයක සිට පැවත එන අය විය යුතු වරිපනම් ශේෂය රු.89,425,049 ක් වී තිබුණි. | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.89,425,049 ක් ව පැවතියද 2024 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා රු.17,413,624 ක් ලැබී තිබූ බැවින් තවදුරටත් හිඟයෙන් අයවිය යුතු ආදායම රු 72,011,425ක් වී තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ කීපයක සිට පැවත එන ලැබිය යුතු විනෝද බදු ආදායම රු.3,080,840 ක් විය. | විනෝද බදු හිඟ මුදල රු. 2,404,976 ක් වේ. මෙම හිඟ මුදල සිනමා ශාලාවක් විසින් ගෙවිය යුතු මුදලක් වන අතර ඉන් රු.2,368,922 ක් සඳහා කඩුවෙල දිසා අධිකරණයේ නඩු පවරා ඇති බැවින් ඒ අනුව අයකිරීම් කටයුතු සිදුකරන බව. | හිඟ ශේෂ අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ කුලී ආදායම රු.14,877,403 ක් අයකර ගැනීමට සභාව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තවදුරටත් හිඟ පවතින කඩ කාමර මුද්‍රා තැබීමට කටයුතු කර ඇති අතර, හිඟ මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කුලී මුදල් අය කර ගැනීමට අදාළ පියවර ගත යුතුය. |
| (ඇ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.37,262,123 ක් හා මුද්දර ගාස්තු රු.652,848,723 ක් විය . | 2023 වර්ෂයට අදාල මුද්දර ගාස්තු දැනට පිටපත් කරමින් පවතින බව. | ගාස්තු නිවැරදිව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහා නගර සහා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 02ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | කඩුවෙල බස් නැවතුම්පල සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව සහ ක්‍රීඩා භූමි සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව සම්බන්ධ අඩුපාඩු සකස් කර නැවත අනුමැතියට ඉදිරිපත් කර ඇති බව. | අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීම කඩිනම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) රන්පැලැස්ස කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සඳහා යොදවා තිබූ සභාව සතු ජේ.සී.බී යන්ත්‍රය ක්‍රියා විරහිත වීම හේතුවෙන් පෞද්ගලික ආයතනයකින් ජේ.සී.බී යන්ත්‍රයක් පැයකට රු. 6400 ක් බැගින් කුලී පදනමට 2022 සැප්තැම්බර් 05 දින ලබාගෙන සේවයේ යොදවා තිබුණි. ක්‍රියා විරහිත වූ යන්ත්‍රය රු.4,951,834 ක මුදලකට අලුත්වැඩියා කර 2023 මාර්තු 27 දින සභාව වෙත ලබා දී තිබුණද තව දුරටත් කුලී පදනම මත ලබා ගත් යන්ත්‍රය 2023 අගෝස්තු 22 දින දක්වා සේවයේ යොදවා ඒ වෙනුවෙන් උක්ත කාල පරිච්ඡේදය සඳහා රු.5,750,400 ක් සභාව විසින් යන්ත්‍ර හිමිකරුට ගෙවා තිබුණි. | පැවති යන්ත්‍රය අලුත්වැඩියා කර සභාවට බාරදෙන විට එම යන්ත්‍ර ක්‍රියාකරුගේ ඉල්ලීම මත බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලයට මාරුකර තිබුණු අතර අලුතින් යොදවන ලද රියදුරු සඳහා පුහුණුව ලබාදීමට සිදුවූ බැවින්ද මධ්‍යස්ථානයේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීම අවශ්‍ය බැවින්ද 2023.08.22 දින දක්වා කුලී පදනම මත ලබාගත් යන්ත්‍රය සඳහා ගෙවීම් සිදුකර තිබුණු බව. | යන්ත්‍රය අලුත්වැඩියා කිරීමෙන් පසු සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ද්‍රව්‍ය මිලදී ගැනීම් විකිණීම් සහ ශේෂ තුලනය කිරීමේ ලේඛනය අනුව නැතිවීම්, ආපසු එවුම් සහ ආරම්භක ශේෂ මඟහැරීම් ඇතුළුව විකුණුම් බවට පත් නොකළ ගැණුම් රු. 2,114,415 ක් වූ අතර දිගින් දිගටම සිදුව තිබූ ඌනතාවය මධ්‍යස්ථානයේ ආදායමට සෘජුව බලපාන බැවින් ඒ පිළිබඳ වාර්තා කිරීම හෝ එය අවම කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ප්‍රතිචක්‍රීකරණ අලෙවි මධ්‍යස්ථානයේ වෙන්කරන ලද ද්‍රව්‍ය ඌනතා වැළැක්වීම සඳහා ද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කර ඇති අතර **CCTV** කැමරා පද්ධතිය අළුත්වැඩියා කර යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන බව. | අලාභානි අවම කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම ලේඛන නිවැරදිව යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ඈ) 1980 අංක 47 දරන මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ පනතේ 23 (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව, අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර පරිසරය දූෂණය විය හැකි අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ පිට කිරීම නොකළ යුතු වුවත්, මධ්‍යම පරිසර අධිකාරියේ හෝ බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය අධිකාරියේ ලියාපදිංචි වී නොතිබුණු ආයතන හා පුද්ගලයන් 07 දෙනෙකු වෙත සභාව විසින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය අලෙවි කර තිබුණි. | විද්‍යුත් අපද්‍රව්‍ය, පොලිතීන් ඇසුරුම් දවටන හා තැඹිලි කෝම්බ ආදායමක් ලැබෙන පරිදි භාරදීම සඳහා ආයතන කිහිපයක් සමඟ ගිවිසුම් ගත වීමට නියමිත බව. | අපද්‍රව්‍ය බැහැර කිරීමේදි යොමුගත පනතේ බලපත්‍ර සහිත ආයතන තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුලදී සභාව විසින් වීදුරු නිෂ්පාදන ආයතනයකට සුදු වීදුරු කි.ග්‍රෑ.91300 ක් හා විවිධ වර්ණ සහිත වීදුරු කි.ග්‍රෑ.4260 ක් අලෙවි කර රු. 1,420,620 ක මුදලක් ලබා ගෙන තිබුණද සභා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොති්බුණි. ලබා ගත හැකි වූ තොරතුරු | ඉදිරියේදී ඒ සම්බන්ධ ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු කරන බව. | ගනුදෙනුව විනිවිද භාවයෙන් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

අනුව සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වීදුරු කටු අලෙවි ආදායමෙන් සභා අරමුදලට බැර නොකරන ලද රු. 1,002,425 ක ආදායමක් පැවතිනි.

### 3.2 අනාථරීක ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලයේ පරිපාලන අංශය මෙගාසිටි ගොඩනැගිල්ල තුල ස්ථාපනය කිරීම සඳහා 2019 වර්ෂයේ වර්ග අඩි 1300 ක් වූ පරිශ්‍රයක යකඩ කණු මත තහඩු පෘෂ්ඨයක කොන්ක්‍රීට් ස්ලැබ් එකක් දමා ඒ සඳහා රු.3,253,840 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ අතර 2019 දෙසැම්බර් 26 දින එම කොන්ත්‍රාත්තුවේ රැඳවුම් මුදල්ද නිදහස් කර තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය වන විටත් එහි ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබූ බැවින් ඉහත ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා තිබූ මුදල නිෂ්කාර්ය වී තිබුණි. | සම්පූර්ණ පරිපාලන ඒකකයම මෙම ගොඩනැගිල්ලට රැගෙන ඒමට තීරණය කර ඇති බව හා උඩු මහලේ බිම් ප්‍රමාණය වැඩිකිරීමට ටෙන්ඩර් කැඳවීමේදි ඇස්තමේන්තු මුදල ඉක්මවා ටෙන්ඩර්කරුවන් මිල ඉදිරිපත් කිරීම හා අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය නතර කර ඇති බව. | ඇස්තමේන්තු ප්‍රතිපාදනය අනුව ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කිරීමට වගබලා ගත යුතුය. |

### 3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලයේ 2023 ජූලි 18 දිනට වීථි පහන් කණු සඳහා විදුලි බල්බ නිකුත් කිරීමට අදාළ ගබඩා පොත්පත් සහ එදිනට ගබඩාවේ පැවති භෞතික තොගය පරීක්ෂා කිරීමේදි වටිනාකම රු:247,500 ක් වූ වොට් 18 LED බල්බ 100 ක ඌනතාවයක් පැවතුණි. | මේ සඳහා විශේෂ පරීක්ෂණයක් සිදුකරන ලෙස පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව. | ගබඩා පොත්පත් යාවත්කාලීන කළ යුතු අතර නිරන්තරයෙන් වගකිවයුතු නිලධාරියකු අධීක්ෂණය කළ යුතුය. |

### 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහා නගර සභා සීමාව තුල පිහිටි භූගෝලීය තොරතුරු අඩංගු කරමින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු 3,560,000 ක් ගෙවා 2015 වර්ෂයේදී පිළියෙල කරන ලද තොරතුරු පද්ධතිය සඳහා බලපත්‍ර නොමැති වීම හේතුවෙන් එය යාවත්කාලීන කිරීමට බලපත්‍ර සහිත මෘදුකාංගයක් 2021 වර්ෂයේදී රු. | පද්ධතිය යාවත්කාලීන කිරීම නිරන්තරයෙන් සිදුකළ යුතු අතර,එය නියමිත කාල පරාසයක් තුලදී නිම කළ හැකි කාර්යයක් නොවේ. ඉදිරියේදී සිදුවන භෞතික වෙනස්වීම් සියල්ල ඒ ඒ අවස්ථා වලදී සිතියම් ගත කිරීම සිදුකළ යුතුය. වීථි පහන් සහ පොදු පහසුකම් | දත්ත ඇතුලත් කර පද්ධතිය යාවත්කාලීන කර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2,395,000 කට මිලදී ගෙන තිබුණි. එහි ගිවිසුම් කාලය 2024 පෙබරවාරි මස අවසන් කිරීමට නියමිතව තිබුණද මෙතෙක් දත්ත සිතියම් ගත කිරීමේ ප්‍රගතිය ගොඩනැගිලි 50% ක්, වීථි පහන් 15% ක් හා පොදු පහසුකම් 10% ක් වැනි අඩු මට්ටමක පැවතුණි. මේ අනුව රු.5,955,000 ක් වැය කර තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වී ඇතත් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | ඉඩම් සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේදී තොරතුරු ලබා ගැනීමේ පවතින ගැටළු හේතුවෙන් ප්‍රගතිය අඩාල වී ඇති නමුත් නිරන්තරයෙන් ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. | |
| (ආ) | සභාව විසින් නොනිම් වැඩ සඳහා ශේෂය ගණනය කිරීමේදී අදාළ ඇස්තමේන්තු මුදල නොනිම් වැඩ ලෙස හඳුනාගැනීම හේතුවෙන් නොනිම් වැඩ ගිණුමෙන් නිවැරදි ශේෂය නිරූපනය වී නොතිබුණි. | එකඟ වන බව | නොනිම් වැඩ නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩුවෙල බස් නැවතුම්පොළ පරිශ්‍රයේ සභා අරමුදලින් ඉදිකරන ලද කඩ කාමර 38 ක් අතුරින් කඩකාමර 13ක් නැවත සභාවට පවරා ගැනීම හා ටෙන්ඩර් ඉදිරිපත් නොවීම නිසා වසා දැමීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට සභාවට රු.2,946,150 ක ආදායමක් අහිමි වී තිබුණි. එසේම තවත් කඩ කාමර 04 ක් 2015, 2016, සහ 2017 වර්ෂ වලදී මුද්‍රා තබා තිබූ අතර නැවත බදු දීමට නොහැකි වීම මත විගණිත දිනය වන විටද එම කඩ වලින් ආදායමක් උත්පාදනය කර නොතිබුණි. | වෙනත් කාර්යයන් සඳහා යොදවා ගැනීමට හැකිවන පරිදි ව්‍යුහය සංශෝධනය කිරීමට තීරණය කර ඇති බැවින් අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට නාගරික ඉංජිනේරු වෙත ඉදිරිපත් කර ඇති අතර අදාළ සංවර්ධන කටයුතු අවසන් වූ පසු නැවත මිල ගණන් කැඳවා බදු දීමට කටයුතු කරන බව. | වසා ඇති කඩ කාමර බදු දී කඩ කුලී ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කඩුවෙල බස් නැවතුම් පොළෙහි කඩ කාමර 04 ක් සංවර්ධන කටයුත්තක් සඳහා 2019 ජනවාරි 01 දින සභාවට පවරාගෙන 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05ක කාලයක් ගත වී ඇතත් අදාළ සංවර්ධන කටයුතු අවසන් කර නැවත බදු දී නොතිබුණි. | එම | එම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලට අයත් කඩ කාමර 06 ක් සඳහා 2013 ජූලි මස ආරම්භයේ සිට ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් වී නොතිබූ බැවින් වර්ෂ 10 ක පමණ කාලයක සිට එමගින් ලැබිය යුතු කුලී ආදායම සභාවට අහිමි වී තිබුණි. | එම | එම |

## 3.6 වත්කම් කළමනාකරණය

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පෙර මිශ්‍රණ අංශයක් පිහිටුවා කාපට් යොදා මාර්ග සංවර්ධනය කිරීම අරමුණු කරගෙන 2017 වර්ෂයේදී රු. 66,612,047 ක් වැයකර මිලදී ගෙන තිබුණු යන්ත්‍ර 06 අතරින් යන්ත්‍ර 2 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2018 වර්ෂයේ ආරම්භ කර තිබූ පෙර මිශ්‍රණ අංශය වෙත යොදවා තිබූ අතර, රු 58,214,750 ක්වූ ඉතිරි යන්ත්‍ර 04 2017 වර්ෂයේ අගෝස්තු 13 දින සිට වසර 06 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව අතුරුගිරිය කාර්යාල පරිශ්‍රයේ රඳවා තබා තිබුණි. | ඉතිරි යන්ත්‍ර 04 විකිණීමට එවැනි යන්ත්‍ර ආනයනය කරනු ලබන ආයතන සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකට අනුව මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ආ) | කඩුවෙල බස් නැවතුම්පොළ පරිශ්‍රයේ උඩුමහලේ කඩ කාමර වලට ප්‍රවේශ වීම සඳහා රු. 3,900,000 ක් වැය කර 2013 නොවැම්බර් මස ස්ථාපනය කර තිබූ විදුලි සෝපානය 2016 වර්ෂයේදී අක්‍රිය වී අවුරුදු 07 ක කාලයක් ගත වී තිබුණද, යථා තත්වයට පත් කර නොතිබුණි. 2021 දෙසැම්බර් 09 දිනැති සභා තීරණ අනුව මෙය බස් නැවතුම් පොළ සඳහා ඵලදායී නොවන බවත් ප්‍රධාන කාර්යාලයේ සුදුසු පරිදි ස්ථාන ගත කිරීමට නිර්දේශ කර තිබුණ ද විගණිත දිනය වන විටත් බස් නැවතුම් පොළෙහි අක්‍රීය වත්කමක් ලෙස පැවතුණි. | මෙම විදුලි සෝපානයේ පවතින යකඩ හා අනෙකුත් කොටස් සම්බන්ධව පරීක්ෂාකර බලා වටිනාකම තක්සේරු කර යෝජිත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදහස් කරන බව. | අවශ්‍යතාව හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැසුම් සකස් කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව ධාවනයෙන් ඉවත් කළ යුතු යැයි තීරණය කර තිබූ ට්‍රැක්ටර් රථ 08 ක් ගලි බවුසර් රථයක්, බොබ් කැට් යන්ත්‍රයක් හා ත්‍රීවීලර් රථයක් 2024 වර්ෂයේ මාස 04 ක් ගතව ඇතත් අපහරණය සඳහා අදාළ මූලික කටයුතු හෝ සභාව ඉටු කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අපහරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කඩුවෙල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව යටතේ සමාලෝචිත වර්ෂය තුල සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්ක 5 ක් ක්‍රියාත්මක කිරීම සඳහා කළ යුතු කාර්යයන් 32 ක් යෝජනා වී තිබුණද ඉන් ක්‍රියාකාරකම් 12 ක් ක්‍රියාත්මක කරවීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මෙහි සඳහන් සම්පූර්ණ කර නොමැති සියළු ඉලක්ක 2024 වර්ෂයේදී ඉටුකිරීමට කටයුතු කරන බව. | ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) පශු වෛද්‍ය කාර්යාලය යටතේ දක්වා තිබුණු ප්‍රමිතියට අනුකූලව සතුන් විකුණන කඩ පවත්වාගෙන යාම හා "සතුන් වෙනුවෙන් අපි" යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදි සුරතල් සතුන් හට වන්ධ්‍යාකරණ සැත්කම් අවස්ථා 04 කදී සිදු කර ඇති බව. | නියමිත කාල පරාසය තුල ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව යටතේ ඉලක්ක 11 ක් සපුරා ගැනීමට යෝජනා වී තිබූ ක්‍රියාකාරකම් 21 අතරින් ක්‍රියාකාරකම් 8 ක ප්‍රගතිය 55% ට වඩා අඩු විය. | 2024 වර්ෂයේදී අවධානය යොමු කර සියළු කටයුතු ඉටු කරන බව. | නියමිත කාල පරාසය තුල ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |